මගේ අංකය: JSC/SEC/CIR – L/2024

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක: 07/2024**

**දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස කටයුතු කරන සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සිවිල් අභියාචන මහාධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිශ්චයකාරවරුන් හා මහේස්ත්‍රාත්වරුන් වෙත.**

**2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධි විධාන ප්‍රකාරව උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම.**

2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අධිකරණ නිලධාරීන් හා උපලේඛනගත රජයේ නිලධාරීන් විසින් ස්වකීය වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කල යුතු අතර නව ක්‍රමවේදය අනුව එලෙස වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගන්නා තෙක් ඉහත කී නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ බාර ගැනීමේ නිලධරයා ලෙසට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 01/2024 මගින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා නම් කර ඇත. ඒ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නැවත නියමයක් කරන තෙක් ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ සබැඳිව පහත සඳහන් පරිදි කටයුතු කල යුතු බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් ඔබට දන්වමි.

(i). සියලුම උපලේඛනගත රජයේ නිලධරයන් විසින් සෑම වර්ෂයකම ජූනි මස 30 වන දිනට පෙර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 01/2024 ප්‍රකාරව ස්වකීය වත්කම් බැරකම් ප්‍රකාශ සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කල යුතුය.

(ii). ඒ ඒ අධිකරණයේ සේවයේ නියුතු සියලු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ සුරක්ෂිතව මුද්‍රා තබා අදාළ කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයා (Judge of the High Court of the Zonal High Court) වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස කටයුතු කරන සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්, සිවිල් අභියාචන මහාධිකරණ විනිශ්චයකාරවරුන්, දිසා විනිශ්චයකාරවරුන් හා මහේස්ත්‍රාත්වරුන් කටයුතු කල යුතුය.

(iii). ඉහත අංක (ii) පරිදි වත්කම් හා බැරකම් ප්‍රකාශ, කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයා වෙත ඉදිරිපත් කිරීමේදී එසේ යොමු කරන ලබන ආවරණ ලිපියේ පිටපතක්, එලෙස වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් පත් කල යුතු නිලධරයන්ගේ නාම ලේඛනයක් සහ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලද නිලධරයන්ගේ නාම ලේඛනයක් වෙන වෙනම කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයාට හා අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයට යොමු කල යුතුය.

(iv). නැවත දැනුම් දෙනතුරු කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් ඉහත අංක (ii) පරිදි ලද වත්කම් හා බැරකම් ප්‍රකාශ, එම කලාපයට අදාල අධිකරණ හා වර්ෂයන් ලෙස වෙන් කර වෙන් වෙන්ව හඳුනා ගැනීමට හැකි අයුරින් සුරක්ෂිතව තබා ගත යුතුය.

(v). කලාප මහාධිකරණ විනිශ්චයකාරවරයාද තමන් යටතේ සේවය කරනු ලබන සියලු උපලේඛනගත රජයේ නිලධරයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ, ඉහත (i) සිට (iv) දක්වා වූ විධි විධාන ප්‍රකාරව ලබා ගැනීමටත්, තබා ගැනීමටත් කටයුතු කළ යුතුය.

(vi). ඉහත සඳහන් කරුණු ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලුම උපලේඛනගත රජයේ නිලධාරීන් වෙත දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච් .එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2024 අප්‍රේල් මස 29 වෙනි දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.